“ඔබ අතරින් කිසිවකු හෝ තම සහෝදරයා හමු වූ විට ඔහුට සලාම් පැවසිය යුතු වේ. ඔවුන් දෙදෙනා අතර ගසක් හෝ බිත්තියක් හෝ ගලක් හෝ මුවා වී නැවතත් ඔහු ව හමු වූ විට, එවිට ද ඔහු ඔහුට සලාම් පැවසිය යුතු වේ.”

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙය්රා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “ඔබ අතරින් කිසිවකු හෝ තම සහෝදරයා හමු වූ විට ඔහුට සලාම් පැවසිය යුතු වේ. ඔවුන් දෙදෙනා අතර ගසක් හෝ බිත්තියක් හෝ ගලක් හෝ මුවා වී නැවතත් ඔහු ව හමු වූ විට, එවිට ද ඔහු ඔහුට සලාම් පැවසිය යුතු වේ.”
[صحيح] [رواه أبو داود]

මුස්ලිම්වරයෙක් තම සහෝදරයාව හමුවන සෑම අවස්ථාවකම ඔහුට සලාම් පැවසීම ගැන නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දිරිමත් කළහ. එය කෙතරම්ද යත් දෙදෙනකු එකට ගමන් කළ ද ගසක්, බිත්තියක්, විශාල ගලක් වැනි යම් බාධකයක් ඔවුන් දෙදෙනා වෙන් කර, පසුව ඔහු ව මුණ ගැසෙන විට නැවත වාරයක් ඔහුට සලාම් දිය යුතුය.

https://sunnah.global/hadeeth/si/show/3552